# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 10
- විෂයය - ඉතිහාසය
- පාඩම - 10- ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය (1 කොටස )


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය - 10 පාඩම




- ඇත අතීතයේ සිට ආසියාව හා යුරෝපය අතර වෙළඳ සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග තුනක් පැවතුණි
- ඒ සියල්ල කොන්ස්තන්තිනෝපල් නගරය හරහා වැටී තිබුණි

- කොන්ස්තන්තිනෝපලයේ සිට පර්සියාව මධ්‍ය ආසියාව හරහා චීනය දක්වා වැටී තිබූ මාර්ගය (සේද මාවත)

- කොන්ස්තන්තිනෝපලයේ සිට මධ්‍යධරණී මුහුද ඔස්සේ , රතු මුහුද හරහා ඉන්දියානු සාගරයට පැමිණි මාර්ගය

- කොන්ස්තන්තිනෝපලයේ සිට බැග්ඩෑඩ් ,පර්සියන් බොක්ක හරහා ඉන්දියාවේ බටහිර වෙරළට පැමිණි මාර්ගය


Europe
Mediterranean Sea
Egypt
Persia
Arabia
India
China
Somalia
Indian Ocean
Java

- ක්‍රි.ව. 1453 දී තුර්කිවරු  කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලා ගැනීමත් සමග යුරෝපය හා ආසියාව අතර පැවැති වෙළදාමට බාධා ඇති විය
- ඉන්පසු මුස්ලිම්වරු විසින් යුරෝපීයයන්ට වෙළඳ අවහිරතා මතු කරන ලදී

- ➢ වෙළඳ ද්‍රව්‍යවල මිල ඉහළ දැමීම
- ➢ භාණ්ඩ හිගයක් ඇති කිරීම
- ➢ කලට වේලාවට භාණ්ඩ නොසැපයීම



- මේ නිසා යුරෝපීයන් පෙරදිගට පැමිණීම සඳහා නව මුහුදු මාර්ග සෙවූහ
- පෘතුගීසින් එහි පෙරමුණ ගෙන කටයුතු කළහ
- පෘතුගාලයේ නාවික හෙන්රි රජතුමා දේශ ගවේෂණයට අනුග්‍රහ දැක්වීය
- ඔහු නාවුක විද්‍යාලයක් පවත්වාගෙන ගියේය
- එහි නාවික ශිල්පය,සිතියම් විද්‍යාව, තාරකා විද්‍යාව ආදිය උගන්වන ලදී



## ➢ පෘතුගීසින් ආසියාවට පැමිණීම



- 1498 දී වස්කෝද්ගාමා නම් පෘතුගීසි නාවිකයා ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණීමත් සමග ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තිය ආරම්භ විය

- අනතුරුව ලන්දේසි, ප්‍රංශ හා ඉංග්‍රීසි වැනි යුරෝපා ජාතීන්ද ආසියාවට පැමිණියහ

## ➢ යුරෝපීයයන් ආසියාවට පැමිණීමේ අරමුණු


- ආර්ථික වාසි ලබා ගැනීම
- ආගම ප්‍රචාරය කිරීම
- ජාත්‍යන්තර කීර්තිය දිනා ගැනීම



- පෘතුගීසින් පෙරදිගට පැමිණෙන විට පෙරදිග වෙළඳ බලය මුස්ලිම්වරුන් සතු විය

- එම වෙළෙඳ බලය තමන් සතු කර ගැනීමට පෘතුගීසීන්ට අවශ්‍ය විය

- " ක්‍රිස්තියානින් සහ කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු " යනුවෙන් වස්කෝදගාමා කළ ප්‍රකාශයෙන් පෘතුගීසීන්ගේ ආර්ථීක හා ආගමික අරමුණු පැහැදිලි වේ



# පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණීම



- පෘතුගාලයේ රජු විසින් පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස ෆ්‍රැන්සිස්කු ද අල්මේදා පත්කර එවන ලදී

- ඔහුගේ පුත් ලොරෙන්සෝද අල්මේදා නැව් කණ්ඩායමක්ද සමග ඉන්දියන් සාගරයේ බල ව්‍යාප්ති කටයුතුවල නිරතව සිටි අවස්ථාවේ කුණාටුවකට හසුවී අහම්බෙන් ලංකාවට පැමිණියේය







- ක්‍රි.ව. 1505 දී ඔහු මෙරටට පැමිණෙන විට ලංකාව ප්‍රධාන කොටස් තුනකට බෙදී පැවතුණි

පරරාජසේකරම්

අටවන වීර පරාක්‍රමබාහු

සේනාසම්මත වික්‍රමබාහු



# කෝට්ටේ රාජධානිය
# (1412–1597)

- හයවන පරාක්‍රමබාහු (1412-1467)
- දෙවන ජයබාහු (1467-1469)
- හයවන බුවනෙකබාහු (1469-1477)
- හත්වන පරාක්‍රමබාහු (1477-1484)
- **අටවන වීර පරාක්‍රමබාහු (1484-1509)**
- නවවන ධර්ම පරාක්‍රමබාහු (1509-1518)
- සයවන විජයබාහු (1518-1521)
- **හත්වන බුවනෙකබාහු (1521-1551)**
- දොන් ජුවන් ධර්මපාල (1551-1597)





- කොළඹට පැමිණි පෘතුගීසීන් කෝට්ටේ රජු හමුවට කැඳවාගෙන යාමේදී වංගු සහිත මාර්ගයකින් ඔවුන් කැඳවාගෙන ගිය බැවින් ප්‍රස්තාව පිරුළක්ද නිර්මාණය විය



## ➢ විජයබා කොල්ලය

- 6 වන විජයබාහු රජතුමාට අග බිසවගෙන් ලැබුණු පුතුන් තිදෙනෙක් විය
    - ➢ බුවනෙකබාහු
    - ➢ මද්දුම බණ්ඩාර
    - ➢ මායාදුන්නේ

- 6 වන විජයබාහු රජුගේ ඇවැමෙන් මෙම පුතුන් තිදෙනාට රජකම උරුම වුවද රජු වෙනත් බිසවකගේ පුතකු වන දේවරාජ නැමැත්තෙකුට රජකම ලබාදීමට සූදානම් විය

- මේ බව දැනගත් අග බිසවගේ පුතුන් තිදෙනා විසින් කුමන්ත්‍රණයක් සිදු කොට පිය රජු ඝාතනය කර බලය ලබා ගත්හ


- මෙයා 1521 විජයබා කොල්ලය නමින් හැඳින්වේ

- ඉන්පසු කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදා කුමාරවරු විසින් පාලන කටයුතු ගෙන ගියහ

හත්වන බුවනෙකබාහු රජතුමා

මායාදුන්නේ

රයිගම් බණ්ඩාර



## ❖ කෝට්ටේ හා සීතාවක රාජ්‍යය අතර ගැටුම්

- රයිගම් බණ්ඩාර මියයාමෙන් පසුව මායාදුන්නේ විසින් රයිගම ද සීතාවකට ඈඳා ගැනීම
- බුවනෙකබාහු රජු තම මුණුපුරාට රජකම ලබාදීමට සූදානම් වීම
- මායාදුන්නේ රජු කෝට්ටේ රාජ්‍යයට අයත් ප්‍රදේශ කිහිපයක් අත්පත් කර ගැනීමට තැත් කිරීම

✓ මේ නිසා මායාදුන්නේගෙන් කෝට්ටේ රාජ්‍යයට කරදර පැමිණෙතැයි බියවූ බුවනෙකබාහු රජු ආරක්ෂාව සඳහා පෘතුගීසීන් කැඳවා ගත්තේය

✓ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් පෘතුගීසීන් බුවනෙකබාහු රජුගේද සහාය ලබාගෙන කෝට්ටේ සිටි මුස්ලිම්වරුන්ට එරෙහිව කටයුතු කළහ

✓ එනිසා මුස්ලිම්වරුන්ගේ සහය සීතාවක මායාදුන්නේට හිමිවිය

✓ මුස්ලිම්වරුන්ගේ ඉල්ලීම මත කැලිකට්වල මුස්ලිම් පාලකයා වූ සැමොරින්ගේ සහායද මායාදුන්නේට හිමි විය


කැලිකට්
සැමොරින් මුස්ලිම්
වෙළඳුන්ගේ
නායකයා
GULF
OF
MANAAR
CEYLON
INDIA
AND
CEYLON
සැමොරින්

- හත්වන බුවනෙකබාහු රජුට පුතුන් නොසිටි අතර  සමුද්‍ර දේවිය නම් දියණියක් විය
- ඇය රණශූරයෙකු වූ වීදිය බණ්ඩාර සමඟ විවාහ වූවාය
- එම යුවලට ධර්මපාල හා  විජයපාල නම් පුතුන් දෙදෙනකු විය
- තමා ඇවෑමෙන් ධර්මපාල කුමරුට රජකම පැවරීමට සිතූ බුවනෙකබාහු රජු ඔහු පෘතුගීසීන්ට භාර කළේය



## ➢ හත්වන බුවනෙකබාහු රජු හා පෘතුගීසින් අතර ඇතිවූ මත ගැටුම්

- හත්වන බුවනෙකබාහු රජු පෘතුගීසි ගැති පාලකයෙක් නොවීය
- එතුමා කතෝලික ආගම වැළඳ ගැනීම ප්‍රතික්ෂේප කළේය
- පෘතුගීසීන් කෝට්ටේ වැසියන්ට ඉතා අධික මිලට තම භාණ්ඩ විකිණීමත්, කෝට්ටේ නිෂ්පාදන අවම මිලට ලබා ගැනීමත් රජුගේ කළකිරීමට හේතු විය

- එනිසා දෙපාර්ශවය අතර මත ගැටුම් ඇතිවිය
- එම මත ගැටුම් අවසන් වූයේ පෘතුගීසි වෙඩි පහරකින් බුවනෙකබාහු රජු මරණයට පත් වීමෙනි

❖ කූතෝ නම් පෘතුගීසි ලේඛකයා වාර්තා කර ඇති පරිදි ක්‍රි.ව.1550 දෙසැම්බර් 29 වන දින රජුගේ මරණය සිදුව ඇත

## ➢ධර්මපාල කුමරු කෝට්ටේ රජවීම

- බුවනෙකබාහු රජු ජීවත්ව සිටියදීම තම මුණුබුරු ධර්මපාල කුමරුගේ පිළිරුවක් පෘතුගාලයට යවා එරට රජු අතින් එම පිළිරුවට ඔටුණු පැළඳවීමට කටයුතු කළේය
- බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසු ධර්මපාල කුමරු කෝට්ටේ රජවිය



## ➢ ධර්මපාල කුමරුට මහජන සහය නොලැබීමට හේතු

- ධර්මපාල රජු පෘතුගීසි රූකඩ පාලකයකු බවට පත්වීම
- කතෝලික ආගම වැළඳ ගැනීම
- කෝට්ටේ රාජ්‍යය තුළ කතෝලික ආගම පැතිරවීමට ඉඩ සලසා දීම
- කෝට්ටේ වැසියන්ට පෘතුගීසීන්ගෙන් සිදුවන අකටයුතුකම් වැළැක්වීමට ක්‍රියා නොකිරීම

✓ මේ නිසා දළදා වහන්සේ පවා සීතාවකට වැඩම කරවන ලදී

❖ අවසානයේ දී ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන්ට පවරා දුන්නේය

## ➢ වීදිය බණ්ඩාර

- බුවනෙකබාහු රජුගේ දියණිය වූ සමුද්‍ර දේවිය විවාහ කරගෙන සිටි වීදියබණ්ඩාර රණශූරයෙක් විය
- ඔහු පෘතුගීසින්ට එරෙහිව ක්‍රියා කළේය
- එනිසා පෘතුගීසීන්ගේ සිරභාරයට ලක්විය
- ඔහුගේ සටන් නිසා පෘතුගීසීන්ට බොහෝ අලාභහානි සිදුවිය
- පසුව එතුමා යාපනයට ගොස් සිටියදී ඇතිවූ ගැටුමකින් මරණයට පත්විය

